


## මෙම සමාගමේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොලෙ හා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපෙලේ පහත සඳහන් තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්මික ශිල්පි (වඩු කාර්මික)11 වන ශ්‍රේණිය

**සුදුසුකම් :**

01 (අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වඩු කාර්මික ක්ෂේත්‍රයේ සහතිකයක් හෝ දෑවුරුද්දකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් වඩු කාර්මික ක්ෂේත්‍රයෙන් සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් ලබා තිබීම.

සහ

(ආ) ආධුනිකත්ව කාලසීමාව හා පාඨමාලා කාලසීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත්‍රයක් පහත සඳහන් ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (වඩු කාර්මික) 11වන ශ්‍රේණිය යන තනතුර** සඳහන් කළ යුතුවේ.

**පාඨමාලා සහතික හා සේවා සහතික වල ජායා පිටපත් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ**

සියළුම අයදුම්පත් පහත සඳහන් ලිපිනයට 2021 මැයි මස 24 වන දිනට පෙර ලැබීමට සලස්වන්න.

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්)ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**